Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - නර්තනය

සතිය-5 සතිය

ශ්‍රේණිය - 07

Prepared by- බළන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය

## තලමල වරුණ කවි

(මාත්‍රා 4 + 4)

ආරා තල් ගස ගොන් වැඩුනා සේ මෝරා තල මල එන අන්දම්

පීරා වරලස අවුල් හරින සේ තල මල සුළඟට යන අන්දම්

දිව්‍ය ලෝක දහසේ ම බැලුවත් මෙහෙම මලක් නැත වෙන අන්දම්

විස්තර කීවට වස්නැත දෙවියන් තල මල සුළඟට යන අන්දම්

(මාත්‍රා 3 + 4)

ලෙල දෙමිනේ මල උඩු ගුවනේ මුතු කුඩ ලෙසිනේ සුළඟට වැනුනේ

සොඳ ලෙසිනේ මිණි හරණ ලෙසේ ඈතට පෙනුනේ රන් කොත ලෙසිනේ

අප ගොසිනේ මල දැක නෙතිනේ සිත පිරිය උනේ නිම නැති ලෙසිනේ

මෙම ලෙසිනේ තල මල පිපුණේ සකි පිය සකිනේ සොඳ ගල මුදුනේ

## තුරඟා වන්නම

තාලය ඃ මාත්‍රා 2 + 3 දෙතිත (සුළු මැදුම් දෙතිත)

බෙර පදය ඃ දොං පිංත ගත දොංත

තානම ඃ තත් තත් තනත් තනෙන - තත් තත් තනත් තනෙන

තත් තත් තනත් තම්ද- නානා

තන තනෙන තන තනෙන - තතන තම්දන තනෙන

තානත් තනත් තම්ද - නානා

කවිය ඃ සත් වෙත් මහත් අදර - ලත් යුත් සිදත් කුමරු
ගත් සිත් තොසත් පැවදි අංගා
අන කරන ඡන්න එන- කන්ථකය අසු ගෙනෙන
ගෙන යෙදූන අසුගෙ පිට නැංගා

ගත් ගත් පයත් අසුගෙ - ශබ්දත් වසත් සුරිඳු
යන්නෙන් තොසින් තිදෙන - සමගා
යන යනෙන කළ තිදෙන - එතැන තැන පසුව දූන
ගං තෙරට පත් උනිය - එමගා

ලත් ලත් සිතත් තිදෙන - වෙත් වෙත් එකත් පසුව
මුත් කන්ථකත් වේය - තුරඟා
සිදුහතුන ගෙන වහන - ඡන්න වල්ගය අතින
පැන්නෙන් එතෙර අනොම - ගංගා

ගොස් සිත් මහත් රුසිරු - ලත් යුත් සිදත් කුමරු
ගෙන් සිත් රැගත් නෙර්ත - අංගා
තිදෙන පැන ගියෙ ගඟින - එතෙද අණ ගෙන බැතින
යෙදුව නැණ වර්ණ යෙන - තුරඟා

කස්තීරම - කුද ගජිත- කුද ගජිත-කුද ගජිත-කුඳ තා//
කුද ගජිත කුද තා //
කුද තා //
කුද ගජිත- කුද ගජිත-කුද ගජිත-කුඳතා
සීරුමාරුව - කුද ගජිජි ගත දොංත- ගජ්ජිං ගජිං ජිගත
කුද ගජ්ජි ගත දොංත දොං තා
අඩව්ව - තත් තකට තකරොන්

**තක්කඩ තක්කඩ කුඳ තකරොං**

**තක රොං ගජිං ජිගත**

**කිටි තකට කුංදත්**

**ජිකරොං**

01 තලමල වරුණ කවි පිළිබඳව ජනමාධ්‍ය ඇසුරින් තොරතුරු සොයන්න.

02 තුරඟා වන්නම ජනමාධ්‍යවලින් අසා ගායනයට පුහුණු වන්න.